**Rohana, (1994), 5, 23-48**

# 17 - 18 සියවස් හි ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පළාත් වල වූ ගණින්නාන්සේලා හා ඔවුන්ගෙන් බුද්ධ ශාසනයට හා දේශීය සංස්කෘතියට වූ සේවාව

එම්. යූ. ද සිල්වා

ශ්‍රී ලංකාවේ මුහුදු බඩ පළාත් වල 17-18 සියවස්හි බුද්ධාගම, දේශීය භාෂා, සාහිත්‍ය හා සංස්කෘතිය අරබයා ඇතිවන සාකච්ඡා වලදී එම කාලය අන්ධකාර යුගයක් සේ සැලකීමට බොහෝ දෙනා පුරුදු වී ඇත. සීතාවක රාජසිංහ රජුට ආරෝපණය කළ 'පීතෘඝාතක' කර්මය හා 'සංඝ සංහාරය' පිළිබඳ සිද්ධීන් අනවබෝධයෙන් චූලවංශයට එක් කළ තිබ්බොටුවාවේ සුමංගල හිමියන් දෙන විස්තර ද [1] විදේශීය ලේඛකයන්ගේ රචනාවල[2] ඇතුළත් බෞද්ධ විරෝධී ප්‍රකාශණ හා ප්‍රතිකාල් ක්‍රියා සාධාරණ කිරීම් හා ඒවායින් ගම්‍යවන සෘජු බලපෑම් ද, රොබට් නොක්ස් [3] උඩරට රාජ්‍ය සම්බන්ධයෙන් ලියූ විස්තර ද, මුං කොටුවේ රාළ ඇතුළු වැලිවිට සරණංකර හිමියන්ගේ සාසනික සේවා අගය කළ රචනා ද [4] උඩරට කතෝලික ආගම ව්‍යාප්ත කරමින් දේශීය ආගම් හෙළා දුටු ඔරටෝරියන් නිකායික ගොන්සල් වේස් පියතුමාගේ රචනාද [5] 'අන්ධකාර යුගයේ' විවිධ අවස්ථා පිළිබඳ චමත්කාර ජනක විස්තර ඉදිරිපත් කර තිබේ. එහෙත් සමකාලීන ඕලන්ද රාජ්‍ය ලේඛන ද සාහිත්‍ය කෘතිවල අන්තර්ගත ඇතැම් තොරතුරු ද පහතරට ප්‍රදේශවල පැරණි විහාරාරාම ආශ්‍රිතව ගොඩනැගී පවතින පුරාවෘත්තද සියුම් විශ්ලේෂණයකට භාජනය කිරීමේදී යථෝක්ත අදහස් එලෙස පිළිගැනීම අපහසු බැව් පෙනේ. ඇතැම් විද්වතුන්ගේ ලේඛන මගින් දැනටමත් මේ මතය සැකයට පාත්‍ර කොට ඇත. මෙහිලා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉතිහාසය පිළිබඳ මහාචාර්යව සිටි කේ. ඩබ්ලිව්. ගුණවර්ධන ද ආචාර්ය ඒ. එම්. මිරැන්ඩෝ [6] ද මූලාරම්භක කාර්යයන් ඉටු කොට ඇත්තාහ. මෙම ලිපියෙන් සාකච්ඡා කිරීමට අදහස් කරනුයේ අන්ධකාර යුගය යයි නම් කළ වකවානුවේ පහත එරට ප්‍රදේශවල බෞද්ධ ශාසනය හා දේශීය සංස්කෘතිය රැකගත් ගණින්නාන්සේලා ඉටු කළ කාර්යභාරය පිළිබඳව ය.

රොබට් නොක්ස් 17 වන සියවසේ මැද භාගයේ උඩරට විසූ 'ගණයි' [7]නම් භික්ෂු පිරිසක් ගැන සඳහන් කරයි. එහෙත් ඔවුහු පසුකළෙක වූ ගණින්නාන්සේලා සේ අඹුදරු පෝෂණය නොකළාහ.

මොවුහු සිවුරක් පොරවාගෙන ඊට උඩින් බඳ පටියක් බැඳ සිටියහ. [8] එහෙත් සඟරජවතේ සඳහන් වන ගණින්නාන්සේලා අඹුදරුවන් පෝෂණය කළ, පන්සල් ඉඩම් හා දේපොල අඹුදරුවන් හා නෑදෑයන් සමඟ භුක්ති විඳි, කුල සිරිත් දූෂණය කළ, නැකැත් හා වෙදකම් කළ කොටසක් බැව් පෙනේ. [9] සිවුරු හැරීමට වුවමනා වූ විට විහාරගම් අන්සතු වීම වැළැක්වීම සඳහා තම සොහොයුරකු හෝ දරුවකු හෝ නැතහොත් අන්‍ය අනුජාතකයෙකු පැවිදි කොට දේපොළ භාර දීම සිරිතක් ව පැවැතිණි. [10] මේ හැර උඩරට වූ ගණින්නාන්සේලා රාජදූත කාර්යන්හි ද යෙදී ඇත්තාහ. පෝයමළු විහාරයේ මහානායක ගණේබණ්ඩාර ගණින්නාන්සේ 1668 දී දෙවන රාජසිංහ රජු වෙනුවෙන් ලන්දේසීන් සමඟ සාකච්ඡා කිරීමට ද දෙවන විමලධර්මසූරිය රජුන් කල අරකන් රටින් භික්ෂූන් ගෙන්වා ගැනීමට ලන්දේසි අධාර ලබා ගැනීමට ද රාජකීය දූතයකු වශයෙන් ක්‍රියා කොට ඇත. [11] පෝයමළු විහාරයේ කොබ්බෑකඩුව ගණින්නාන්සේ නරේන්ද්‍රසිංහ රජු කාලයේ පුත්තලම් ප්‍රදේශයේ දිසාව වශයෙන් ද උඩුනුවර සිව් දේවාලයේ බස්නායකනිළරයා වශයෙන් ද කටයුතු කොට ඇත. [12] තවද හෙතෙම කීර්ති ශ්‍රී රාජසිහ රජුගේ අභිෂේක මංගල්‍යයේදී රාජ්‍යප්‍රාප්තිය ලේඛනාරූඪ කළ නිලධරයා ද විය. [13] පොදුවේ මොවුහු උඩරට දී ගණින්, ගණින්නාන්සේ, ගණේල්ලෝ නමින් ද ඔවුන්ගේ දරුවෝ ගණ ගැටයෝ නමින් ද හඳුන්වන ලදහ. [14]

අප ප්‍රස්තුත කාලයට අයත්වන පහත රට ගණින්නාන්සේලා වූ කලී දේශපාලන හේතූන් නිසා ස්වේච්ඡාවෙන්ම එම තත්ත්වයට පත් වූ අය ය. සීතාවක රාජසිංහගේ මරණයෙන් පසු පහතරට ප්‍රදේශවල බලය පිහිටුවා ගත් පෘතුගීසීහු කතෝලික ආගම ව්‍යාප්ත කිරීමට මෙන්ම දේශීය ආගම් විනාශ කිරීමක ද යෙදුණාහ. 15 වන සියවස අවසානයේ පාප් වහන්සේලාගෙන් ලැබූ ප්‍රඥප්ති මගින් ආසියාතික හා අප්‍රිකා රාජ්‍ය වල කතෝලික ආගම ව්‍යාප්ත කිරීමට ලැබූ බලය දෙවියන් වහන්සේ වෙනුවෙන් සිය යුතුකම් ඉටුකිරීමක් සේ සලකා පෘතුගීසි අධිරාජ්‍යයා ක්‍රියා කරන්නට විය. [15] පූජක ආශිර්වාදය මත සොල්දාදුවන් මුන්නේශ්වරමේ සිට දෙවුන්දර තුඩුව දක්වා බෞද්ධ හා හින්දු ආගමික මධ්‍යස්ථාන විනාශ කර දැමූ ආකාරය පෘතුගීසි ලේඛකවරුන් ම විචිත්‍රාකාරයෙන් වර්ණනා කොට ඇත. [16]

පෘතුගීසි පාලන සමය තුළ බෞද්ධ හා හින්දු ආගම් ඇදහීම නීතියෙන් තහනම් කළ බවට සාධක නොමැත. [17] එනමුදු ක්‍රියාත්මක

සියලු මාර්ගවලින් ඒවා විනාශ කර දැමීමට පියවර ගැනිණ. පූජකයන්ගේ හා නිලධාරීන්ගේ ආශීර්වාදය මත සෙබළුන් විසින් බෞද්ධ හා හින්දු ආගමික මධ්‍යස්ථාන විනාශ කර දැමූ අතර භික්ෂූන් වහන්සේලා හා හින්දු පූජකකයන්ට සිය ජීවිත ආරක්ෂාව සඳහා ආරක්ෂිත ස්ථාන බලා යාමට සිදු කෙරිණි. ඒ අතරම ස්වදේශීය ආගම් ප්‍රසිද්ධියේ ඇදහීමට ඇති ඉඩකඩ අහුරාලිමෙන් හා කතෝලික ලබ්ධිය වැළඳගත්තවුනට වරප්‍රසාද හා අනුග්‍රහ දැක්වීම මාර්ගයෙන් ස්වදේශීය ආගමික මධ්‍යස්ථාන පවත්වාගෙන යාම අපහසු කෙරිණ.

ආසියාතික විජිත වල කතෝලික ආගම ව්‍යාප්ත කිරීම සම්බන්ධ තීරණ ගනු ලැබුවේ ගෝවේ ආගමික සමමේලනය මගිනි. 1567 දී පැවැත් වූ පළමු සම්මේලයේදී ම අවි බලය යොදා හෝ භය ගැන්වීම් තුළින් අන්‍යාගමිකයින් කතෝලික ලබ්ධියට ගෙන බෞතීස්ම කිරීම නීතියට අනුකූල නොවේ යයි තීරණය කෙරිණ. එනමුදු ඉන් ආගමික සහනශීලී ප්‍රතිපත්තියක් අනුගමණය කිරීමක් ප්‍රකාශිත වූ බවක් නො පෙනේ. ප්‍රතිකාල් යටත් ප්‍රදේශවල ඇති කතෝලික නොවන ආගමික සිද්ධස්ථාන විනාශ කර දැමීම හා ඒවායේ පූජකයන් තම බල ප්‍රදේශයෙන් පළවා හැරීම එම සම්මේලනය මගින් ම අනු දැන තිබිණි. (18) මේ නිසා ප්‍රතිකාලුන් යටතේ ප්‍රබල පීඩනයකට දේශීය ආගම් පාත්‍ර විය.

ක්‍රිස්තියානි ආගමට මෙන් රටම ආවේනික වූ සංවිධාන ක්‍රමයක් බෞද්ධාගම සතු නොවීය. ශ්‍රී ලංකා රාජ්‍ය ආගම සේ බුද්ධාගම පිළිගත් දා සිට බුද්ධ ශාසනය ආරක්‍ෂා කොට පෝෂණය කළේ රජතුමා ය. රජතුමා නැතිවූ විට බෞද්ධ සංවිධානය ද බිඳ වැටිණ. ප්‍රතිකාලුන්ට මුහුදු බඩ පළාත් වල පාලන බලය ලැබීමත් සමඟ ඒ ප්‍රදේශවල බුද්ධ ශාසනයට ප්‍රධාන කැපකරු දායකයා නැතිවිය. භික්ෂූවට කසාවත් හැඳ ප්‍රසිද්ධියේ ආගමික කටයුතු වල යෙදීමට අවසර නොවීය. බෞද්ධ විහාරාරාම විනාශකොට ඒවා සතු දේපොල කතෝලික ආගමික සංවිධාන වලට පවරා තිබූ අවදියක වෙහෙර විහාර නටබුන් හා පූජනීය ස්ථාන රැකබලා පවත්වාගෙන යාමට ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වී ජීවිත පරිත්‍යාගයෙන් ක්‍රියා කළ මෙම පිරිස ගණින්නාන්සේවරු වශයෙන් හැඳින්වෙති.

කෝට්ටේ රාජ්‍යය තුළ ජාත්‍යන්තර විද්‍යායතන මට්ටමින් බැබළුණු මහ පිරුවන් ප්‍රතිකාල් බලය මුල්බැස ගැනීමට පෙරම කතෝලික ප්‍රහාරයට ගොදුරු වී විනාශ විය. එතෙක් ඒවා තුළ ශාස්ත්‍රීය කටයුතු වල නිරත වූ භික්ෂූන්ගෙන් කොටසක් ආරක්ෂිත ප්‍රදේශ කරා ඇදී ගිය අතර බහුතරය සිවුරු හැර ලෞකික කටයුතු වල නිරත වන්නට වූහ. පුස්තකාලවල වූ අගනා පත පොතින් ආරක්ෂිත ස්ථාන කරා ගෙන යා නො හැකි වූ සියල්ල විනාශ වූ අතර රැකගත් කොටසින් ද සැලකිය යුතු ප්‍රමාණයක් කාලයාගේ ඇවෑමෙන් ස්වභාව ධර්මයාගේ බලපෑමට යටත් වී විනාශය කරා ඇදිණ. මහ පිරුවන්හි රාශිභූතව පැවති ආගමික, ශාස්ත්‍රීය, විද්‍යාත්මක, තාක්ෂණික හා සෞන්දර්යාත්මක දැනුම මෙම ප්‍රවාහයන් ඉදිරියේ අසරණව කොටස්වලට බිඳී තැන තැන විසිරී පුද්ගලයන් තුළ ආරක්ෂා වන්නට විය. භික්ෂූන් වහන්සේ ළඟ හා පසුව ගණින්නාන්සේලා ළඟ හැකි පමණින් ධර්ම ග්‍රන්ථ සුරැකිණ. ගිහියන් බවට පත්ව ප්‍රතිකාලුන්ගේ පාසල් සේවාවට සම්බන්ධ වූ ගුරුවරුන් වෙත යම් ප්‍රමාණයක පත පොත රැකිණ. ගුරු ගෙදර අය නමින් භාවිතයට එක් වූ එම පිරිස් පරපුරෙන් පරපුරට ශාස්ත්‍ර ඥානය කිසියම් ප්‍රමාණයකින් රැක ගැනීමට සමත් වූහ. වෛද්‍ය වෘත්තියට බටවුන් ළඟ මූලික සංස්කෘත වෛද්‍ය ග්‍රන්ථ රැකිණ. වෙද ගෙදර නමින් භාවිතයට එක්ව පරපුරෙන් පරපුරට දැනීම ආරක්ෂා කර ගනිමින් සමාජ සේවාවෙහි යෙදුණු මොවුහු ප්‍රතිකාල් හා ඕලන්ද රජයන් යටතේ ද සම්භාවනීය මෙන්ම අත්‍යාවශ්‍ය පිරිසක් බවට පත්වූහ. පිරිවෙන්වල දී ආධාර කර ගත් ඖෂධීය උද්‍යාන හා පර්යේෂණාගාර වලින් තොර වූ මෙම වෛද්‍ය සේවාව වෙනස් වී ගොස් කාලයත් සමඟ අක්ෂි, කෞමාර, ගෙඩි, වණ, පීනස්, කැඩුම් බිඳුම් ආදී අංශවල විශේෂ පරිචයක් වූ පාරම්පරික වෙද මහතුන් පිරිසක් බිහි කිරීමට සමත් විය. වෙනස් වී ගිය තත්ත්වය යටතේ සාහිත්‍යකරණය වඩාත් ලෞකික වූ අතර විරුදාවලි, හටන් කවි හා ශෘංගාරාත්මක රසාස්වාදනයට මුල් තැන දී කළ නිර්මාණ බිහිවන්නට විය.[19]

විනාශකර දැමූ පූජනීය ස්ථාන රැක ගනිමින් බෞද්ධයන්ගේ සමාජයීය හා ආගමික අවශ්‍යතා සපුරාලමින් කතෝලික පූජකයන් ගේ හා ප්‍රතිකාල් අධිකාරයේ පීඩනයෙන් දේශීය සංස්කෘතිය ආරක්ෂා කර ගැනීමෙන් හා බෞද්ධ සිරිත් රැකීමෙන් බෞද්ධ අයිතීන් දිනා ගැන්මේ ව්‍යායාමයේ නිරත වූවෝ ගණින්නාන්සේවරු වූහ. ඔවුන්ගෙන් පළමු පරපුර විහාරාරාමවල වැඩ විසූ දැඩි සිත් ඇති ආගම වෙනු වෙන් ජීවිත

පරිත්‍යාගයෙන් කටයුතු කිරීමට ඉදිරිපත් වූ අය ය. මොවුහු කසාවත් පෙරවීම ආරක්ෂා රහිත වූ විට මුලාදෑනි හා පූජකයන්ගේ ග්‍රහණයෙන් මිදෙනු පිණිස ගෘහස්ථයන් සේ පෙනී සිටිමින් සුදුවත් හැඳ දසසිල් සමාදන්ව ඥාති පවුල් තුළ ජීවත්වෙමින් ගැමියාගේ දෛනික හා කාලීන ආගමික වත් පිළිවෙත් පවත්වාගෙන යාමට දායක වූහ. බෞද්ධයනට ආගමික වත් පිළිවෙත්වල යෙදීමට භික්ෂුවකගේ සහභාගිත්වය අත්‍යාවශ්‍ය නොවීය. එහෙත් කාලයක් තිස්සේ වර්ධනය වූ සාමූහික ස්වරූපයක් ගත් වැඳුම් පිදුම් හා වත් පිළවෙත් රාශියක් බෞද්ධයන් තුළ මුල් බැසගෙන තිබිණි. අනාරක්ෂිත අවදියක පවුලේ ඥාතීන්ට එකී වත් පිළිවෙත් ගෘහය තුළම පැවැත්විය හැකි විය.

ප්‍රතිකාල්ලු පාසල හා පල්ලි වටා තම ආගමිකයන් සංවිධානය කරන්නට වූහ. සබත් දින (ඉරිදා) හෝ යොදා ගත් වෙනයම් දිනක පාසලේ හෝ පල්ලියේ පැවැත්වුණු කතෝලික දේව මෙහෙයට බැතිමතුන් සියලු දෙනා සහභාගි කරවීමට ඔවුහු පියවර යෙදූහ. සබත් දින හා ක්‍රිස්තු ආගමික දින රජයේ විවේක දිනයන් කෙරිණි. මෙවැනි පසුතලයක බෞද්ධයන් විසින් පෝදා පන්සල මුල්කොට පවත්වාගෙන ආ සාමූහික එක්වීමකට මං පෑදු සිල් සමාදන්වීම්, පෙරහැර පැවැත්වීම්, පිරිත් සජ්ඣායනා, ධර්මදේශනා පැවැත්වීම් තව දුරටත් කළ නො හැකි විය. ඒවා සීමිත පිරිසකට ආරක්ෂිත පසුතලයක අවස්ථාවෝචිතව පවත්වා ගෙන යාමට ගණින්නාන්සේලා ආධාර කළහ. තම ප්‍රදේශවල තුබූ බෞද්ධ විහාරාරාම ප්‍රතිකාල් සෙබළුන් විසින් කඩා බිඳ දැමූ ආකාරය බොහෝදෙනා තුළ ඒවන විටත් මතකයේ රැඳී තිබිණි. මේ නිසා බෞද්ධ සිද්ධස්ථාන රැක බලා ගෙන බෞද්ධයන්ගේ ආගමික වත් පිළිවෙත් පවත්වා ගැනීමට ආධාර කළ ගණින්නාන්සේලා ආරක්ෂා කිරීම සාමූහික යුතුකමක් සේ ගැමියා හඳුනා ගත්තාට සැක නැත.

මුහුදු බඩ පළාත් වල ඕලන්ද බලයට යට වී පැවැති කාලයේ බුද්ධාගම මුහුණ පෑ තත්ත්වය මීටත් දරුණු විය. ඔවුන්ගේ ආගමික ප්‍රතිපත්තිය 1642 බතාවියා ව්‍යවස්ථාව මගින් පාලනය වූ අතර ඔවුන්ගේ බල ප්‍රදේශය තුළ අන්‍ය ආගම් ඇදහීම හා ප්‍රචාරය කිරීම නීතිය මගින්ම තහනම් කර තිබිණි. [20] 1638 දී දෙවන රාජසිංහ (1635-1687) රජුගේ ආරාධනය පිට ඔහුගේ පිහිටට පැමිණි ලන්දේසීහු ආධාර ගිවිසුම් පරිදි 'යුද්ධ වියදම් ගෙවන තෙක් ප්‍රදේශ රැකීමේ' කාර්යක යෙදී

සිටින අතරම රාජසිංහ රජුගේ නායක හිමිවරුන් කිහිප පලකගේ සහභාගිත්වය ඇතිව කතෝලික ආගම වැළඳගෙන සිට නැවත බුද්ධාගම වැළඳගත් මුලාදෑනී පිරිසක් මාතර දිස්ත්‍රික්කයේ කෙලවරක ගොඩනැගූ බෞද්ධ විහාරයක් 1647 දී විනාශ කර දැමූහ. යථෝක්ත විනාශ කිරීම පිළිබඳව බතාවියා බලධාරීන්ට කරුණු පැහැදිලි කළ ඕලන්ද නායක මාත්සුකර් රජුගේ නමින් පාලනය ගෙන යමින් රජුගේ ආගමට එරෙහිව ක්‍රියාකිරීම අපහසු වන බව පෙන්වා දුන්නේ ය. (21) අවස්ථාවෝචිතව කටයුතු කරමින් ඕලන්ද සමාගමේ බලධාරීන්ගේ නියෝගය ක්‍රියාත්මක කිරීමට බතාවියෙන් ලංකාවේ ආණ්ඩුකාරවරයාට උපදෙස් ලැබිණ. 1957 සැප්තැම්බර් 8 වන දින ගාල්ල හා මාතර දිස්ත්‍රික්කයේ ද 1657 සැප්තැම්බර් 15 වන දින කොළඹ දිස්ත්‍රික්කයේ ද ප්‍රසිද්ධ කළ ප්ලැකාට් ආඥාවක් මගින් කිසිවෙකුට සබත් දින හා ක්‍රිස්තියානි ආගමික උත්සව දිනවල කායික වැඩ පලවල යෙදීම, වෙළඳාමේ යෙදීම හා කර්මාන්ත වල යෙදීම තහනම් කර එය උල්ලංඝනය කරන්නන් දඩයකට හෝ බන්ධනාගාර ගත කිරීමකට පාත්‍ර කෙරිණ. (22) මෙය කෙළින්ම බෞද්ධ ජීවන ක්‍රමයට එල්ල කළ පහරක් විය. පසුව නිකුත් කළ ප්ලැකාට් මාර්ගයෙන් බෞද්ධයන්ට හා බෞද්ධ වත් පිළිවෙත්වල යෙදෙන්නන්ට එරෙහිව ක්‍රියාකරන නියෝග මාලාවක් පැනවිණ. මේවා 1678, 1682, 1699, 1709, 1711, 1713 හා 1732 වර්‍ෂ වල නිකුත් කළ ප්ලැකාට්ස් මාර්ගයෙන් තව තවත් වර්ධනය කරනු ලැබීය. 1732 නිකුත් කළ නියෝගයක් (23) මගින් කැල්වින් වාදී නොවන ආගමික පුද පූජාවල යෙදෙන්නන්ට රික්ස් ඩොලර් 200 ක දඩයක් ද ප්‍රසිද්ධියේ කස පහර තැලීමට ද දම්වැල් වලින් බැඳ අවුරුදු 25 ක කාලයක් කොම්පැනියේ වැඩ කිරීමට ද යටත් කෙරිණි. ඒ සමඟම ස්වදේශීය මුලාදෑනින් මාස දෙකක් ඇතුළත තම බල ප්‍රදේශ වල ඇති බෞද්ධ විහාරාරාම විනාශ කිරීමට ද එසේ නොකරන අයට තදබල දඬුවම් පමුණුවා කේප් කොළණියට පිටුවහල් කරන බවද නියෝග කෙරිණ. තවද සමාගමේ බල ප්‍රදේශ තුළ බෞද්ධ භික්ෂුවට ජීවත්වීමට හා සැරිසැරීමට ඉඩදිය යුතු නැතැයි ප්‍රකාශ කොට බෞද්ධ පුද පූජාවල යෙදෙන අය අල්ලා දම්වැල් වලින් බැඳ අවුරුදු තුනක බරපතල වැඩ සහිතව බන්ධනාගාර ගත කිරිමට ද නියම කෙරිණ.

ඕලන්ද පළාත් වල බෞද්ධ කටයුතුවලට එරෙහිව බෙහෙවින්ම බලපෑවේ ජන ජීවිතය දෛනිකව පල්ලිය - පාසල හා සම්බන්ධ කොට තිබූ නිති රීතිය. මෙයද ප්‍රතිකාලුන් විසින් ආරම්භ කොට ඕලන්දයන්

විසින් විධිමත් කළ ක්‍රියා මාර්ගයකි. ලන්දේසි බල ප්‍රදේශය තුළ බිළිදෙකු ඉපිද මාස 4 ක් ඉකුත් වීමට පෙර ක්‍රිස්තියානි චාරිත්‍ර අනුව ඒ බිළිදා බෞතීස්ම කළ යුතු වේ. [24] බෞතීස්ම කිරීම ක්‍රිස්තියානි ජීවිතයක මුලාරම්භයයි. එමෙන්ම රට වැසියකු වශයෙන් ලාභ ප්‍රයෝජන රාශියකට හිමිකම් ලැබීමක් ද විය. ඕලන්ද රජය යටතේ රැකියා කිරීම, ඉඩම් බදු ගැනීම, බදු අය කිරීමේ අයිතිය මෙන්ම පරපුරකට වැඩි කලකට ඉඩම් ප්‍රදානයක් ලැබීමට ඒ සුදුසු කමක් විය. වහලුන් තබාගත හැකි වූයේ ද ක්‍රිස්තියානින්ට පමණි. උසාවියක් ඉදිරියේ සාක්ෂ්‍යයක් වශයෙන් පිළිගැනුණේ ද ක්‍රිස්තියානි භක්තිකයෙකු දුන් සාක්ෂ්‍යයක් පමණි. මේ සියල්ලට වඩා වැදගත් වූයේ දෙපොල උරුමයයි. [25] දෙමාපියන් සතු දේපොල වලට නීත්‍යානුකූල උරුමක්කාරයෙකු වීමට සුජාතයෙකු විය යුතුයි. සුජාතයකු වීමට දෙමාපියන් පල්ලියේ විවාහ වී තිබිය යුතුයි. නැතහොත් ඔහු අවජාතකයෙක් වේ. දේපොල උරුමයද අහිමි වේ. ඕලන්දයන් විසින් සකස් කළ පවුල් තෝම්බු වල මෙවැනි අවජාත දරුවන් පිළිබඳ තොරතුරු එමට ඇත. අධිකරණයක් ඉදිරියේ දේපොල උරුමය පිළිගැනීමට පාසැල් තෝම්බුවල උපත, බෞතීස්මය, පාසලට ඇතුළත්වීම, විවාහය හා මරණය පිළිබඳ සටහන් සැලකිල්ලට ගැනිණ. 1700 පමණ වන විට බෞතීස්ම නොකළ අයගේ දේපොල වලින් 1/3 ක් රාජ සන්තක කෙරිණ. [26]

දරුවන් බෞතීස්මයෙන් වලකා සිටින දෙමාපියෝ දඬුවම් වලට ද යටත් කෙරුණාහ. බිළිදෙකු ඉපිද මාස 4 ක් ගත වීමට පෙර බෞතීස්ම නො කරන දෙමාපියෙකුට දඬුවමක් වශයෙන් ලන්දේසි සමාගම සඳහා මාස 4 ක බරපතල වැඩ කිරීමට සිදුවිය. සෑම දරු උපතක් ම මෙලෙස ලියාපදිංචි කිරීම හා බෞතීස්ම කිරීම සහතික කිරීමක් වශයෙන් ගම්වල සේවාව කළ රජකයා ලවා ගැබ්ගත් ස්ත්‍රීන් පිළිබඳ තොරතුරු රැස්කිරීමට ද පියවර ගැනිණ. [28] රජකයා සෑම ගෙයකටම පැමිණෙන්නෙකු වූ හෙයින් ද ඔහුගෙන් ආවරණය කෙරුණු ගැබ්ගත් ස්ත්‍රියක් ගමේ සිටිය නොහැකි වූයෙන් ද මෙම තොරතුරු ලැබීමේ මාධ්‍යය ඉතා විශ්වාසවන්ත විය. ගමේ සිදුවන සෑම දරු උපතක් මෙන්ම මරණයක් පිළිබඳව ද රජකයා රජයේ නිලධාරීන්ට වාර්තා කළ යුතු විය. එවැනි වාර්තා කිරීම් පිළිබඳව විධිමත් ක්‍රියා මාර්ග නොගත් අයට එරෙහිව ක්‍රියා කිරීමේ බලය දිසාවට පවරා තිබිණ.

බෞතීස්ම කළ සෑම ළදරුවෙකුම වයස 6 දී පාසල් යැවීම අනිවාර්ය වූයේ ය. ඔහු නිතිපතා පාසල් පැමිණෙන බවට දෙමාපියන්

වගබලා ගත යුතු විය. නො එසේ නම් තදබල දඬුවමකට යටත් කෙරිණි. බොහෝ ගම් වල පාසල හා පල්ලිය එකක් වූයේ ය. දරුවෙකු ක්‍රිස්තියානි ජීවිතයට හැඩ ගැස්වූයේ පාසලේදී ය. ඔහු අධ්‍යාපනය කළ දෑ ආගම හා සම්බන්ධ වී තිබිණි. ශිෂ්‍යයන්ගේ පාසල් පැමිණීම සහතික කිරීමට දෙමාපියන්ට පැමිණ වූ දඩවලට අතිරේකව පාසල් ගුරුවරයාට මෙන්ම පාසල් නොපැමිණෙන ළමුන් ගැන සොයා බැලීමට පත් කර තිබූ මෙරින්ඤ්ඤ නම් නිලධාරියාට ද රාජකාරී වගකීම් පැවරී තිබිණි. සබත් දින හෝ යාඥා පැවැත්වීමට යොදාගත් දිනවල දෙමාපියන් දරුවන් ද සමඟ දේව මෙහෙය සඳහා පල්ලියට යා යුතු විය. නැතහොත් නොපැමිණෙන වාරයක් සඳහා තඹ කාසි 4 බැගින් දඩ මුදල් ගෙවිය යුතු විය. පුරුද්දක් වශයෙන් පල්ලියට නො එන අය පිළිබඳව දිසාවේ ට වාර්තා කෙරිණි. එවිට මුලාදෑනි මාර්ගයෙන් පියවර ගනු ලැබිණි. එවැන්නකදී ලැබෙන දඬුවම ද බරපතල වූයේ ය.

බෞතීස්ම කළ අය පල්ලියේ විවාහ විය යුතු විය. [30] බෞතීස්ම කර චාරිත්‍රානුකූලව පල්ලියේ විවාහ නො වුවහොත් රික්ස් ඩොලර් 3 ක දඩයකට යටත් කෙරිණි. නිසි අයුරින් දඩය නොගෙවුවහොත් එබන්දෙක් මාස 3 ක බන්ධනාගාර ගතකිරීම මෙන්ම බරපතල කායික වැඩපලට ද යටත් විය. විවාහ වී ඇති පාර්ශ වලින් එක් අයෙක් බෞතීස්ම නොවූවෙකු නම් හෙතෙම දම්වැල් වලින් බැඳ මාස 6 ක් බන්ධනාගාරගත කිරීමට ද යටත් කෙරිණි.

මෙම තත්ත්වය යටතේ ප්‍රසිද්ධියේ බෞද්ධාගමික කටයුතුවල යෙදීම බෙහෙවින්ම අන්තරාදායක විය. පන්සල හෝ භික්ෂුව නැතිව බෞද්ධයෙකු වශයෙන් ජීවත්වීමට හැකි වුවද පන්සල හා භික්ෂුව වටා කාලයත් සමඟ වර්ධනය වී ජන සමාජයට ඇතුළත් වූ බෞද්ධ චාරිත්‍ර හා උත්සව කටයුතු භික්ෂුවකගේ සහභාගීත්වයෙන් තොරව ක්‍රියාත්මක කිරීම අපහසු කාර්යයක් වූයේ ය. විදේශීය ජාතියක් විදේශීය ආගමක් දේශීය හවුල්කරුවන් මාර්ගයෙන් බලහත්කාරයෙන් පවත්වාගෙන යාමේදී දේශීය ආගමික පුජකයන්ට වෙස්වලා ජීවත් වීමට අවශ්‍ය ආරක්ෂාව පොදුජන සමාජයෙන් ලැබීම පහසු විය. එහෙත් එවැනි අවිහිංසාවාදී ක්‍රියා මාර්ගයක් දීර්ඝ කාලයක් තුළ තර්ජනාත්මක පසුබිමක පවත්වාගෙන යාමට කිසියම් ප්‍රමාණයක කැපවීමක් අවශ්‍යය. එය ආගමික භක්තියත්, ජාතික හැඟීමත් එක් තැන් කළ ව්‍යායාමයක් වූයේ ය.

රහස් සංවිධානයක් වශයෙන් ක්‍රියාත්මක වූ ගණින්නාන්සේලා පිළිබඳව හෝ ඔවුන්ගේ කටයුතු පිළිබඳව හෝ ක්‍රමවත් විස්තරයක් සකස් කිරීමට ප්‍රමාණවත් ලේඛනගත තොරතුරු ශේෂ වී නොමැත. මෙවැනි සිද්ධීන් ලේඛණගත නොවීම නිසා ම ඔවුන්ගේ කාර්ය භාරය නොසලකා හැරිය නොහැක. කොළඹ නගරයට ආසන්න කැලණි රජමහා වෙහෙර හා සම්බන්ධ ක්‍රියාකාරකම් පිළිබඳව තරමක විස්තර ඕලන්ද ලේඛන වල ඇත. මේ පිළිබඳව උඩරට රාජධානිය ද මැදිහත් වීම ඊට හේතු විය. ඕලන්ද පාලනයේ අවසාන කාලයේ බෞද්ධයන් සම්බන්ධ සහනශීලී ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමට ඕලන්දයට බල කෙරුණු මෙම රහස් ක්‍රියාවලිය පිළිබඳ අඛණ්ඩ විස්තරයක් දිය නොහැක. යළි පුනරුත්ථාපනය කළ පැරණි ආගමික මධ්‍යස්ථාන හා ඒවායේ පුනරුත්ථාපන කටයුතු සම්බන්ධ පුරා වෘත්ත හා ජනප්‍රවාද ගණින්නාන්සේලා පිළිබඳ විධිමත් අධ්‍යයනයකදී ආධාර කර ගත හැකි වැදගත් තොරතුරු මාධ්‍යයක් වුවද මෙම පර්යේෂණයේදී ඒවා ගැඹුරෙන් අධ්‍යයනය කිරීමට අවස්ථාවක් නොවීය. එනමුදු මෙම ලිපියෙන් ඉදිරිපත් කෙරෙන ඓතිහාසික පසුතලය එවැනි ගැඹුරු අධ්‍යයනයකට අත්වැලක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ගණින්නාන්සේලා මෙන්ම තහංචි වලට පාත්‍ර වී සිටි කතෝලික පූජකවරුන් රහස් සංවිධානයක් වශයෙන් ක්‍රියා කළ ආකාරය පිළිබඳ ලියවුණු ලිපි ලේඛණ දැනට ශේෂව ඇත. ඒවායේ දැක්වෙන තොරතුරු ආශ්‍රයෙන් ගණින්නාන්සේලා ද ඊට සමාන ක්‍රියා මාර්ගයක් අනුගමනය කරන්නට ඇත යන්න උපකල්පනය කළ හැක්කේ ය. ඕලන්දයන් කතෝලිකයන්ට ආගම ඇදහීමට තහංචි පනවා තිබියදී 1687 ජනවාරි 3 වන දින මැංගලෝරයෙන් ලංකාව බලා ආ බ්‍රාහ්මණ වංශික සන්කෝල්ලේ වැසියෙකු වූ ජෝසප් වාස් පියතුමා කැනරා, තෙලි වෙයිරා, කොචිං හා ටුටිකෝරින් හරහා මන්නාරමට පැමිණියේ වෙස්වලා හිඟන්නෙකු වශයෙනි. ඔහු යාපනයට ඇතුළු වීමට පෙර දෙමළ භාෂාව උගත්තේය. කුණාටුවකට අසුවූ ඔහු ගමන් කළ මුස්ලිම් යාත්‍රාව දින 20 ක් ගමන් කොට ඉමහත් දුෂ්කරතා මධ්‍යයේ මන්නාරමට ළඟා වන විට ජෝසප් වාස් පියතුමා අතිශයින්ම දුර්වලයකුගේ තත්ත්වයෙන් පසු විය. (31) පසුව යාපනයට ගොස් මහළු ස්ත්‍රියකගේ මඩුවක කල් ගත කොට අතීසාර රෝගය වැළඳී භාස්කමකින් මෙන් සුවය ලැබූ බව ඔහු සඳහන් කරයි. ඒ අතර තුර රහසිගතව පැරණි කතෝලිකයන් හමු වූ පියතුමා ඔවුන් විසින් ආරක්ෂා සහිත ස්ථානයක රඳවනු ලැබ අන් අයට

නොදැනෙන සේ රාත්‍රී කාලයේ දේව මෙහෙයන් පවත්වා ඇත. අවුරුදු දෙකක් මෙලෙස රහසිගතව ආගමික කටයුතු කළ අතර රජයට ලැබුණු ඔත්තුවක් අනුව 1689 නත්තල් දින දේව මෙහෙයක් පවත්වද්දී කඩා වැදුණු රජයේ හමුදා අතින් කතෝලිකයින් විශාල ගණනක් ජීවිතක්ෂයට පත්වෙද්දී හාස්කමකින් මෙන් වාස් පියතුමා සිය දිවි බේරා ගත්තේ ය. පසුව ඔහු වෙස්වලා ගෙන පුත්තලමට පැමිණ ලංකාවේ විවිධ පළාත්වල සැරිසරා උඩරට රාජ්‍යයට ඇතුළු වීමට උත්සාහ කිරීමේ දී සිරගත කරනු ලැබ අනේක විධ දුෂ්කරතා මධ්‍යයේ ජීවත්ව රජුගෙන් අවසර ලබා උඩරට කතෝලික ආගමික ප්‍රචාර කටයුතු ගෙන ගියේය. ආරක්ෂක නිලධාරීයාගේ ඇසට නො වැටී පියවර හතරක්වත් ගත නො හැකි යයි වාස් පියතුමා සඳහන් කළේ එකල පැවති මුරකාවල් වල දැඩිකම පැහැදිලි කිරීමට ය. [32]

ජෝෂප් වාස් පියතුමා අනුගමනය කළ ජාකොම් ගොන්සල්වේස් පියතුමා 1705 අගෝස්තු 30 වන දින ලංකාවට ඇතුළු වූයේ ද මෙවැනිම දුෂ්කරතා මධ්‍යයේ ය. ඇතැම් විට මාළු මරන්නකු සේ ද තවත් විටෙක සිඟන්නෙකු සේ ද වෙස්වලා පැමිණ උඩරට ප්‍රධාන මධ්‍යස්ථානය කරා ගොස් එතැන්සිට පහතරට ප්‍රදේශවලද කතෝලික ආගම ව්‍යාප්ත කිරීමට ඔහු දැඩි වෙහෙසක් දරා ඇත. [33] කතෝලික පූජකවරුන් සිය ආගමික පුද පූජා පැවැත්වීමේදී කැල්වින් වාදීන් ගෙන් මෙන්ම බෞද්ධයන්ගෙන් ද හින්දුන්ගෙන් ද අවහිරකම් වලට මුහුණ දුන්නා සේ ම බෞද්ධයන් සිය කටයුතු ගෙන යාමේදී කතෝලික හා කැල්වින්වාදී ආගමිකයන්ගේ අවහිරකම්වලට ද මුහුණ දුන්නේ ය.

ගණින්නාන්සේලාට තම කටයුතු පවත්වා ගත යුතු වූයේ හොඳින් දැන හැඳිනගත් ප්‍රදේශවල හා බෞද්ධ වත් පිළිවෙත් අගය කළ සමාජයක් තුළ ය. ඔවුනට ආරක්ෂා වීමට සිදුවූයේ ලන්දේසි නිලධාරීන්, පූජකයන් හා ඕලන්දයන්ට හිතවත් කම් දැක්වූ මුලාදෑනීන්ගෙනි. ඔවුනට උඩරට රජතුමාගෙන් සැලකිය යුතු පිටුබලයක් පසු කලෙකදී ලැබිණ. ආර්ථිකවාසි, තනතුරු, බලතල, වරප්‍රසාද තකා කැල්වින්වාදය පිළිගෙන ඕලන්ද රජයේ මුලාදැනිකම් දැරූ බොහෝ ලාංකිකයන්ගෙන් ද පසුව මොවුනට අනුග්‍රහය ලැබුණු බව පෙනේ. මේ නිසා සුදුවතින් සැරසුණු ගණින්නාන්සේලා විනාශ වී ගිය ආරාම අසල කලක් ජීවත් වූ බව පෙනේ. ඔවුන් ජීවත් වූ අඩවිය ගණේගොඩ, ගණේගොඩැල්ල, ගණේ ගෙදර ආදී නම් වලින් හැඳින්වීමට පටන් ගත් බවක් පෙනේ. බුද්ධාගම නීති විරෝධී කළ විට ඔවුනට ආරක්ෂිත ස්ථාන බලා යාමට සිදුවිය.

මෙම කාලපරිච්ඡේදය තුළ මොවුහු සිංහල, පාලි හා සංස්කෘත දැනුම අඛණ්ඩව ආරක්ෂා කර ගැනීමට සමත් වූ අතර පැරණි පත පොත හැකිතාක් සුරැකිව තබා ගැනීමට ද සමත් වූහ. නක්ෂත්‍රයේ පරිචයක් තිබූ මොවුහු ගම්වල වූ ජන්ම ශක්තියක් ඇති තරුණයන් තම භාරයේ රඳවාගෙන දන්නා ශිල්ප ශාස්ත්‍ර හැකි පමණින් ඔවුනට කියා දීමට ද පියවර ගත්හ. මහ පිරුවන් පැවති සමයේ දී වූ ගැඹුරු තාර්කික පාණ්ඩිත්වයක් මොවුනට නොතිබුණ ද භාෂා ශාස්ත්‍රය හා ආගමික අතින් ඔවුහු විශ්වකෝෂ දැනුමක් ඇති අය වූහ. ලන්දේසි පැරිෂ් පාසල් වලින් පල්ලිය ගුරුන්නාන්සේලා ප්‍රමුඛ පිරිස් ක්‍රිස්තියානි ආගම හා මුසුකළ ශාස්ත්‍රීය දැනුමක් ලබාදී මෙහි නිරත වූ අතර පල්ලියට සම්බන්ධ නොවූ හෝ පල්ලි වලින් ඈත පිහිටි ප්‍රදේශ වල දරුවන්ට ආගමික අවබෝධය මෙන්ම භාෂා ශාස්ත්‍රීය දැනුමක් ලබා දීමේ උපස්ථම්භක වූවාහු ගණින්නාන්සේලා ය. මෙය ක්‍රිස්තියානි පූජකවරුන්ගේ ලේඛනවලින් ද සනාථ වේ.

ඕලන්ද අධිකාරය ප්‍රබලව පැවතියේ වාණිජ හා ආර්ථික සම්පත් වලින් ආඪ්‍ය වූ බහුතර ජනකායක් වාසය කළ මීගමුව, කොළඹ හා ගාල්ල දිස්ත්‍රික්කවලය. ඒවා කුරුඳු නිෂ්පාදනයේ ප්‍රධාන ස්ථාන විය. ඒවායේ ඕලන්ද අධිකාරයේ සියුම් සුපරීක්ෂාකාරීකම හා කැල්වින් ආගමික පූජකවරුන්ගේ කටයුතු ද සංකේන්ද්‍රය වී තිබිණ. එම ප්‍රදේශ වල මිථ්‍යාදෘෂ්ටිකයන් ඇත්දැයි සොයා බැලිමට දිසාවේ හා කපිතාන් ගෙවල් පවා සෝදිසි කළහ. මාතර දිසාවනිය ආර්ථික වශයෙන් වැදගත් වූයේ එහි වූ ලෝහ කර්මාන්තය කෙරුණු කම්හල් විශාල ප්‍රමාණයක් පිහිටීම හා ඇත් සම්පතින් ද කුළු බඩු විශාල ප්‍රමාණයක් නිපදවීම ද නිසාය. එසෙකුදු වුවත් එහි රජතුමාගේ බලපෑම ප්‍රබල විය. රත්නපුරය හරහා උඩරට රාජ්‍යය සම්බන්ධ වූ මාගී පිහිටි මෙම ප්‍රදේශයේ මුලාදෑනීන් කෙරෙහි රජු නිරන්තරයෙන් බලපෑම් කිරීම නිසා ද එහි ලන්දේසීන් පොරොන්දු කඩ කොට බලහත්කාරයෙන් රජුගේ ප්‍රදේශ අල්ලා සිටින්නේය යන රජුගේ අදහසට ඔවුන් ගරු කළ නිසා ද නිරන්තර කැරළි කෝලාහල හට ගැනිණ. ගණින්නාන්සේලා ද මාතර හම්බන්තොට ප්‍රදේශවල සිට පැල්මඩුල්ල රත්නපුර හරහා නුවර සමඟ සම්බන්ධතා පැවැත්වූ අතර පැල්මඩුල්ල ඔවුනට සුරක්ෂිත ඉසුඹුහලක් ද වූයේ ය.

හම්බන්තොට ඕලන්ද බල ප්‍රදේශ වලින් තවත් ඈත්වී තිබිණ. උඩරටට හා පහතරටින් ලුණු සැපයුණු ප්‍රධාන ලුණු ලේවා මේ

ප්‍රදේශයේ තිබුණ ද ජන ශූන්‍ය වුයේය. 1767 දී ලන්දේසි පාලකයන් සිය අධිකාරීන්ට දන්වා ඇති පරිදි හම්බන්තොට දිස්ත්‍රික්කයෙන් විශාල ප්‍රදේශයක් ඇතුළත් වූ මාගම් පත්තුවේ ජන සංඛ්‍යාව වූයේ 208 ක් පමණි [35]

ලන්දේසීන් 18 වන සියවස ක්‍රියාත්මක කළ දරදඬු නීතිරීති ඉදිරියේ ගණින්නාන්සේලාට රැකවරණ සැපයුනේ ඕලන්ද උකුසු ඇස්වලින් දුරස්ථව පිහිටි මාතර හම්බන්තොට දිස්ත්‍රික්කවලය. ඒවායේ ද නුවර රාජධානියට ආසන්නව පිහිටි කඳුකර ගල්ගුහා සහිත ප්‍රදේශ ඔවුන්ගේ ස්ථිර වාසස්ථාන බවට පෙරළිණ. මුල්ගිරිගල,කතරගම, තිස්සමහාරාමය, බඳගිරිය, කොටවාය, කහගල, අමංගල, කහඳාව, වේහැල්ල, කහඳාමෝදර, පතුමුල්දෙණිය, ගලවුඹ වැනි ආරක්ෂා සහිත වුත් පහසුවෙන් පුනරුත්තාපනය කළ හැකි වුත් පැරණි වෙහෙර ආශ්‍රිතව ඔවුහු තම කටයුතු ගෙන ගියහ. කලින් කල ගමින් ගමට යමින් ආරක්ෂිත ස්ථාන වල ආගමික වත් පිළිවෙත් හා පුද පූජා පැවැත්වූ ගණින්නාන්සේලා පෙර සඳහන් කළ පරිදි ප්‍රබල ජන්ම ශක්තියක් ඇති උද්‍යෝගිමත් තරුණයන් මහණ කර ගනිමින් ද ඉඩ ලද අවස්ථාවල ඔවුන්ට ශිල්ප ශාස්ත්‍ර ඉගැන්වීමෙන් ද බෞද්ධාගම ආරක්ෂා කිරිමේ නිරත වූ තරුණ ගෝල පිරිසක් ඇති කළහ. මෙලෙස දුෂ්කර අවස්ථාවල ප්‍රව්‍රජ්‍යාවට ඇතුළත් වූ තරුණන් වැඩි දෙනෙකු වෙද මහත්වරුන්ගේ පරම්පරාවලින් ආ බවද පැහැදිලිය. තම ගෝලයන් සමඟ තැනින් තැන සංචාරය කළ ගණින්නාන්සේලා වැඩි කලක් එක් තැනක ජීවත් වූයේ වස්සාන කාලවලදී ය. කිසියම් ගමක ප්‍රභූවරයෙකු ගණින්නාන්සේට ආරක්ෂාව සැපයීමට සමත් වුයේ නම් එතැන වස් වැසීමද ඒ කාලය තුළ ඒ ස්ථානයේ ආගමික කටයුතු පවත්වාගෙන යාමද ගෝලයන්ට ඉගැන්වීමද කරනු ලැබීය. මෙම කාලය තුළ උපසම්පදා කටයුතු පැවැත්වීමට අවකාශයක් නො වූ හෙයින් උපසම්පදාව ලැබූ භික්ෂූන් නො වූ හෙයින් ද උපසම්පදාව නො ලැබ ක්‍රියා කිරීමට ගණින්නාන්සේලාට සිදු විය. එහෙත් ඔවුහු පාරිශුද්ධ ජීවිත ගත කරමින් පාලි සංස්කෘත භාෂා පිළිබඳ දැනුම ගෝලයන්ට ලබාදීම ද ධර්ම ග්‍රන්ථ ආරක්ෂා කොට පවත්වා ගෙන් යාමද ඔවුන් වැඩ විසූ ස්ථාන අසල ගැමි දරුවන්ගේ අධ්‍යාපනික හා සදාචාරාත්මක වර්ධනයට දායක වීමටද සමත් වූහ. මොවුන් රාජකීය සන්නස්වල ගණවොලින් [36] නමින්ද ඕලන්ද ලේඛනවල සිල්වතා යනුවෙන් ද හඳුන්වා ඇත.

මේ රටේ බුදුන්ගේ නම මිසක් ආගම පැවතීම් කිසිවක් නැතිව බුදුන්ට මල් පමණක්දී යකුන්ට ගස් ගෙඩි ආදී සියළු වස්තුව තහනම් කර දෙන හෙයින් යක්ෂ ඇදහිල්ල විනා, බුදුන්ගේ ඇදහිල්ලේ කිසිත් නැති බව සත්තයයි දැන ගත යුතුයි[37] යනු වෙන් ජාකොම් ගොන්සල්වේස් පියතුමා බුද්ධාගමට එරෙහිව සිය ප්‍රචාරක කෘතියක් වූ බුද්ධ බණ ප්‍රත්‍යක්ෂයේ උඩරට ප්‍රදේශයේ වූ ගණෙල්ලෝ පිළිපැදි බෞද්ධ සිරිත් විරිත් වලට පහර දෙන අතරම ගෝවේ ජොෂ්ඨයන්ට ලියමින් මාතර වාසින් ශාස්ත්‍ර ප්‍රගුණ කළ අයය. බුදුන්ගේ ආගම අදහන හොඳම පිරිස් වශයෙන් පෙනී සිටින් ඔවුන් අතුරින් නොයෙක් නිකායන් බිහිවී ඇත. ඔවුන් අප ආගමට හරවා ගැනීමට සමත් වූවහොත් නුවර දක්වා අන් ප්‍රදේශවල අය කතෝලික ආගමට හරවා ගැනීම පහසු වනු ඇතැයි[38] දන්වා සිටියේය. මේ සඳහා ඔහු මාතර ප්‍රත්‍යක්ෂ[39] නමින් බුදුන්ගේ ධර්මය අවතක්සේරු කරමින් කෘතියක් ද කළේ ය. හෙතෙම මාතරට පැමිණ මුලාදෑනින් විශාල පිරිසක් කතෝලික ආගමට හැර වූ බව සඳහන් කරයි.

මාතර හම්බන්තොට ප්‍රදේශ වල බෞද්ධාගමික කටයුතුවල යෙදුණු මෙම ගණින්නාන්සේලා උඩරට රජතුමා සමග ද උඩරට රාජධානියේ වූ බෞද්ධ විහාරාරාම හා භික්ෂූන් වහන්සේලා සමගද නිරන්තර සම්බන්ධතා පැවැත්වූහ. කලින් කල ඔවුන් උඩරට ප්‍රදේශවල සැරි සැරූ අතර උඩරට භික්ෂූන් වහන්සේලා ද පහතරට ප්‍රදේශවලට පැමිණ ආගමික උත්සව වලට සහභාගී වී ඇත. එනමුදු ෆන් හූන්ස් පිය පුතු දෙදෙනාගේ (1660-1678) පාලන කාලය තුළ දෙවන රාජසිංහ රජතුමා මුහුදුබඩ ප්‍රදේශ ජන ශූන්‍ය කිරීම් වැඩ පිළිවෙලක පිහිටා සිටි කාලයේ දී ගණින්නාන්සේලාට ද අපහසු කාලයක් උදාවන්නට ඇත. ඔවුන් එකල නුවර රාජධානිය අසල කඳුකර පළාත්වල සිට සිය කාර්යයන් ගෙන යන්නට ඇත.

ලෝරන්ස් පිල් (1679-1692) ආණ්ඩුකාරයාගේ පාලන කාලයේ සිට රාජසිංහ රජු සමග සහනශීලී ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම නිසා ඉන්පසු කාලයේ ගණින්නාන්සේලාගේ හා උඩරට භික්ෂූන්ගේ ක්‍රියාකාරිත්වය ප්‍රබල වූ බැව් පෙනේ. 1687 දෙවන විමලධර්මසූරිය රජතුමා ගේ අභිෂේක මංගල්‍යය අවස්ථාවේ පහතරට වැසියන් විශාල පිරිසක් සහභාගී වීම ඕලන්දයන් තුළ මහත් භීතියක් ඇති කෙළේ ය.[40] ඒ අතරම විමලධර්මසූරිය 11 රජු (1687-1707) පහතරට වාසීන්ට නිදහසේ බුද්ධාගම ඇදහීමට අවස්ථාව සලසා දෙන ලෙස

ඕලන්දයන්ගෙන් ඉල්ලීය. [41] එතාවක් ප්‍රතික්ෂේප කර 1696 දී රක්ඛංග දේශයෙන් උපසම්පදාවට භික්ෂූන් ගෙන්වා ගැනීමට ඔවුන් ආධාර කළේ රජු අමනාප වේ ය යන බිය නිසාය. මෙලෙස රක්ඛංග දේශයෙන් වැඩම කළ සන්ථාන හා ලෝකගුරුපුභී මහ තෙරුන් ඇතුළු භික්ෂූන් 33 දෙනා විසින් නුවර මහවැලි නදියේ උදකුක්ඛෙප සීමාවේදී පැවැත්වූ උපසම්පදා උත්සවයේ දී භික්ෂූන් 30 කට උපසම්පදාව දී මෙන් ද තවත් සාමණේරවරුන් 120 ක් ප්‍රව්‍රජ්ජාවට ඇතුළු කිරීමෙන්ද කළ ශාසනික සේවාවට මෙලෙස පහත රටින් ගිය භික්ෂූන් වහන්සේලා ද ඇතුළත් වන්නට ඇත.

ඕලන්දයන්ගේ බෞද්ධාගමික ප්‍රතිපත්තිය කෙරෙහි වෙළඳ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේද, බතාවියේ අග්‍රාණ්ඩුකාරවරයා ඇතුළු සභාවේද ලංකා ආණ්ඩුකාරවරයාගේ ද එකිනෙකට වෙනස් වූ ප්‍රතිපත්ති ගැටුමක් පැවැතුණි. ඕලන්ද වෙළඳ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස වූයේ සිය බල ප්‍රදේශ තුළ බෞද්ධ පන්සල් සෑදීම වැළැක්වීම පමණක් නොව බලය යොදා හෝ ඒවා විනාශ කළ යුතු බවය. එතෙකුදු වුවත් යුරෝපයේ හා ආසියාවේ සිය බල ස්ථාවරත්වයේ ඇති දුර්වලකම් තේරුම් ගත් අග්‍රාණ්ඩුකාරවරයා ඇතුළු සභාව එවැනි දැඩි ප්‍රතිපත්තියක නො පිහිටා අවස්ථාවෝචිතව ක්‍රියා කිරීමට උපදෙස් දුන්හ. ඒ අනුව උඩරට රාජ්‍යය ආසන්නයේ පන්සල් හැදීමට විරුද්ධව නොයන ලෙස අවවාද කළ ඔවුහු මුහුදු බඩ තීරයේ පන්සල් හැදීම නතර කරදැමිය යුතු යයි කීහ. මේ අතර ඕලන්ද ආණ්ඩුකාරවරයා ප්‍රෙඩිකාන්ට්වරුන්ගේ චෝදනා වලට ලක්වීම මෙන්ම උඩරට රජතුමාගේ හොඳ හිත දිනාගෙන ආර්ථික වාසි ලබා ගැනීමේ ක්‍රියා පිළිවෙතක් තුළ මැදිවිය. [42] මේ නිසා ලන්දේසි ප්‍රතිපත්තිය අවස්ථානුකූලව ක්‍රියාවට නැංවූ අතර තහංචි එලෙසම පැවතිණ.

උඩරට රාජ්‍යය හා ලන්දේසීන් අතර හිතවත්කම් දියුණුවීමත් සමඟ පහතරට ගණින්නාන්සේලාගේ ක්‍රියාකාරකම් ද වැඩිවිය. මේ අතර ප්‍රෙඩිකාන්ට්වරුන්ගේ චෝදනා ලෝරන්ස් පිල් වෙත එල්ල වන්නට වූ අතර අධ්‍යක්ෂ මණ්ඩලය ඔවුන්ගේ බලපෑමට යටත් වුවහොත් ඇති විය හැකි අවදානම් තත්ත්වයෙන් ගැලවීම උදෙසා බෞද්ධාගම හා බෞද්ධ වත් පිළිවෙත් පැවැත්වීම නීති විරෝධී කෙරෙන ආඥාවක් 1682 දී නිකුත් කළේ ය. [43] එනමුදු ඔහු ක්‍රියාත්මක වීමේදී ආඥාව පරිදි කටයුතු කිරීමෙන් වැළකී සිටියේය. මේ අතර උඩරට රජතුමා පහතරට

ප්‍රදේශවල බෞද්ධයන්ට ආගමික නිදහස පවරණ ලෙස ද ත්‍රිකුණාමලයේ හා කැලණියේ විනාශ කර දමා ඇති බෞද්ධ වෙහෙර පුනරුත්තාපනය කිරීමට අවසර දෙන ලෙස ද 1689 මාර්තු 12 වන දින තල් පතකින් ඉල්ලා සිටියේ ය. (44) කැලණිය මේ වන විට බෞද්ධ කටයුතු වල එක් මධ්‍යස්ථානයක්ව පැවතිණි. ප්‍රතිකාල් සමයේ විනාශ කොට තිබූ කැලණි විහාරය ගණින්නාන්සේලාගේ ඉදිරිපත් වීම නිසා බැති මතුන්ගේ පූජනීය ස්ථානයක් බවට පෙරළිණ. පැරණි ස්තූපය පුනරුත්ථාපන කිරීමේ පියවර ද ගෙන තිබිණ. මේ අතර 1688 වෙසක් පෝය කාලයේ විශාල පින්කමක් සංවිධානය කර තිබූ අතර ඊට නුවරින් පැමිණි භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ වී තිබිණ. ක්‍රිස්තියානි රජයක මූලස්ථානය අසලම මිත්‍යා දෘෂ්ටිකයන්ගේ උත්සව නිදැල්ලේ පැවැත්වීමට ඉඩ දීමත් ඊට විශාල පිරිස් සහභාගිවීමත් නිසා කුපිත වූ ප්‍රෙඩිකාන්ට්වරුන්ගේ පෙළඹවීම මත ක්‍රියාත්මක වූ ප්‍රදේශයේ පාසල් ගුරුවරයා සහාසික අන්දමින් බෞද්ධ බැතිමතුන්ට පහර දීමට කටයුතු කළේය (45) පහර කෑ බෞද්ධයෝ පන්සල් භූමියේ ඉදිකොට තිබූ පාසලද විනාශ කර දැමුවා පමණක් නොව ප්‍රෙඩිකාන්ට්වරුන් විසින් යළි තැනූ පාසලට කිසිදු ළමයෙක් එවීමෙන් වැලකී සිටියහ. එම කාලය තුළ ඔවුන්ගේ දේපොල උරුමය ආරක්ෂා කර ගැනීමේ අටියෙන් දෙමව්පියෝ දරුවන් බෞතීස්ම කිරිම සඳහා පැලියගොඩ පාසලට ගෙන ගියහ. මේ අතර 1691 දී උඩරට රජතුමා කැලණියේ සිදුවූ දේ පිළිබඳ සොයා බලා වාර්තා කිරීම සඳහා ඔහුගේ නිලධරයෙක් කැලණියට එවීය. මේ අතර ප්‍රෙඩිකාන්ට්වරුන් සිද්ධිය පිළිබඳව බතාවියට වාර්තා කළ අතර 1692 දී විහාර භූමිය නැවත පූජකයන් අතට පත් කෙරිණ. නුවරින් ආ භික්ෂූන් වහන්සේලා ආපසු නුවරට වැඩම කෙරිණ. (46)එනමුදු ගණින්නාන්සේලාගේ බලපෑම නිසා බෞද්ධ සිරිත් විරිත් අගය කළ රටවැසියා අලුත තැනවූ පාසලට තම දරුවන් නොයැවූ හෙයින් පාසල අභාවයට ගියේය.

1699 වන විට කැලණි වෙහෙර යළි පුනරුත්ථාපනය කරනු ලැබ අප්‍රියෙල් මාසයේ දී උඩරට නායක භික්ෂුවක් තවත් භික්ෂූන් 300 ක් පිරිවරා සියතැ කෝරළය හරහා පැමිණ පහන් දහසක පූජාවක් පැවැත්වීය. පින්න පාත්‍ර ගණින්නාන්සේ කෙනෙකු එම උත්සවයට මුල්ව ක්‍රියා කොට ඇත. (47) මෙලෙස බෞද්ධ කටයුතු ප්‍රබලවීම නිසාද බෞද්ධයන් ඔවුන්ගේ ආගමික සිරිත් විරිත් පැවැත්වීමෙන් වෙළඳ සමාගම කෙරෙහි ඇති පක්ෂපාතිත්වයට පාඩුවක් නොවන බැව් ආණ්ඩුකාරවරයා පිළිගත් හෙයින් ද නිරන්තර ගැටුමෙන් එකී

පක්ෂපාතිත්වය පළුදු විය හැකි හෙයින් ද ප්‍රෙඩිකාන්ට්වරුන්ගේ විරෝධය මැද්දේ රජයේ අවසරය මත ප්‍රදේශයේ විදානේ විසින් 1704 දී පන්සල බෞද්ධයන්ට භාර දෙන ලදි. (48)

ඕලන්දයන්ගේ ප්‍රධාන පරිපාලන හා ආගමික මධ්‍යස්ථානය වූ කොළඹට සමීපව පිහිටි කැලණි විහාරය මුල් කොට ඇති වූ බෞද්ධ ප්‍රතික්‍රියාව මෙලෙස ලේඛන ගත වුවද රාජ්‍ය නිලධාරින්ගේත් ප්‍රෙඩිකාන්ට්වරුන්ගේත් අධීක්ෂණයෙන් ඈත් වූ මාතර හා හම්බන්තොට දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක වූ ප්‍රතික්‍රියා ලේඛන ගත වූයේ කලාතුරකිනි. එනමුදු එම ප්‍රදේශ බෞද්ධ පුනර්ජීවනයේ මධ්‍යස්ථාන වූයේ ය. දැනට ශේෂව ඇති මුල්ගිරිගල, අම්ංගල, කසාගල වැනි ප්‍රදේශවල ඇති ලෙන් විහාරවල නටබුන් මෙයට කදිම තිහඩ සාක්ෂ දරයි. මීට අතිරේකව මෙම කාලය තුළ බිහිවූ සාහිත්‍ය කෘතීන්ගේ වැඩි කොටසක් බිහිවී ඇත්තේද, මෙම පළාත් වලිනි. (49) ඒ හැර ඕලන්ද ප්‍රෙඩිකාන්ට්වරු පාසල් පරීක්ෂණ පිළිබඳ සැපයූ වාර්තාවල එම ප්‍රදේශයේ කැල්වින් වාදීන්ගේ පාසල් වලට ළමුන්ගේ පැමිණීම බෙහෙවින්ම පහළ ගිය බවද සාමාන්‍ය වශයෙන් ගත් කල ඒ ප්‍රදේශවල සාක්ෂරතාව ඉතා ඉහළ බවද පෙන්වා දෙති. (50) මෙම කාලය තුළදීම බුද්ධාගමටත් කැල්වින් වාදයටත් එරෙහිව කතෝලික ආගම නහා සිටුවීම සඳහා ජීවිත පරිත්‍යාගයෙන් ක්‍රියා කළ කතෝලික පූජකවරුන්ගේ ලේඛන වලින් මේ බව තවත් තහවුරු වේ. ගොන්සල්වේස් පියතුමා දෙන තොරතුරු අනුව මාතර ප්‍රදේශයේ බෞද්ධ කටයුතු ප්‍රබලව කෙරීගෙන ගොස් ඇත. (51) මෙම කාලයේ උඩරටින් කොළඹට පැමිණි භික්ෂුවක් මහත් හරසරින් පිළිගෙන ආණ්ඩුකාරවරයාගේ අවසරයෙන් ගාල්ල හා මාතර ප්‍රදේශවල සැරිසැරූ අතර බෞද්ධයන් විසින් මහත් භක්ත්‍යාදරයෙන් පිළිගත් බව සඳහන් වේ. (52) ඒ වන විට මාතර ප්‍රදේශයේ පල්ලි - පාසල් ක්‍රියා විරහිත තත්ත්වයකින් පැවැති අතර පාසල් පරීක්ෂණ නො පැවැත්විණ. ගාලු ප්‍රදේශයේ පාසල් පරීක්ෂකයන් වූ ටී. ඩබ්ලිව්. මැරිනුස් හා ස්කොලාච් හුගවාර්ඩ් දී ඇති වාර්තා අනුව කැල්වින් වාදය ඇදහීමට බොහෝ දෙනා මැලිකමක් දැක් වූ අතර ක්‍රිස්තියානි ආගමට අඩු ගෞරවයක් දැක් වූ බවද සඳහන් වේ. මෙය වඩාත්ම සලාගම කුලය අතර ප්‍රචලිත ප්‍රතික්‍රියාවක් සේ ඔහු හඳුනා ගනී. (53)

මේ කාලය වන විට ඕලන්ද උඩරට සම්බන්ධතා කුරුඳු තැලීමට අවසර ලැබීම මත රැඳී තිබිණ. කාලයක් තිස්සේ ආරක්ෂාවකින් තොරව

කුරුඳු කැපීම නිසා මුහුදුබඩ පළාත් වල කුරුඳු පැල විනාශ වී ගොස් තිබිණි. (54) වෙළඳ සමාගමට අවශ්‍ය කරුඳු තොගයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් සපයා ගත්තේ උඩරට රාජ්‍යය තුළිනි. ඒ සඳහා වාර්ෂිකව අවසර ගත යුතු වූ අතර ඊට ප්‍රමාණවත් පුද පඬුරු රැගෙන තානාපතියන් උඩරටට ගිය අතර ඇති වූ සාකච්ඡාවල දී පහතරට වාසීන්ට නිදහසේ බුද්ධාගම අදහීමට ඉඩකඩ ලබා ගැනීම ගැනද සාකච්ඡා කෙරිණි.

මෙම පසුතලය යටතේ ගණින්නාන්සේවරු තම කටයුතු වල මහත් උද්‍යෝගයෙන් යෙදෙන්නට වූහ. උඩරටින් භික්ෂූන් වහන්සේලා වැඩිපුර පහතරට ප්‍රදේශවලට පැමිණ සැරිසරන්නට වූ බව සිමන් ආණ්ඩුකාරවරයා (1703-1707) වාර්තා කොට ඇත. ඒ අතරම ප්‍රෙඩිකාන්ට්වරුන්ගේ ප්‍රකාශන භාෂ්‍යයට ලක්කොට පත්‍රිකා එල්ලීමේ වැඩ පිළිවෙලක් ද බොහෝ තැන ආරම්භ වී තිබිණි. එහෙයින් බෞද්ධයන් පිළිබඳව ක්‍රියාකළ යුතු ආකාරය ගැන කොළඹ දිසාව, ගාලු කොමාන්ඩර්, මාතර දිසාව ඇතුළු දේශපාලන මණ්ඩලයේ කිහිප දෙනෙකුගෙන් යුත් කොමිටියක් මගින් කරුණු විමසා බැලිණි. බෞද්ධයන් තමන්ට ආවේනික වූ ආගම ඇදහීම තුළින් ඔවුන්ගේ පක්ෂපාතීත්වය සමාගමට නොලැබී යාමට ඉඩක් නැති බව පෙන් වූ ඔවුහු බෞද්ධයන්ට එරෙහිව ක්‍රියා කිරීමෙන් උඩරට රජතුමා විරුද්ධ කර ගන්නේ නැතිව එවැනි සිද්ධීන් නො සලකා හැරීමට යෝජනා කළහ. (55) මේ අතර ගණින්නාන්සේලා ගාල්ල,මාතර වැනි නගරවල බෙහෙවින් සැරිසැරූ බව ද ඇතැම් විට පිණ්ඩපාතය සඳහා වැඩම කළ බවද වාර්තා වී ඇත. 1706 උකුවෙලින් පිටත් වූ තෙරුන්නාන්සේ කෙනෙක් තවත් 15 දෙනෙකු සමඟ වැලිගම් බලා යන අතර මගදී ආපසු හරවා යැවීමක් ගැන ද තොරතුරු වාර්තා වී ඇත. උද්‍යෝගිමත්ව ආගමික කටයුතු වල යෙදුණු ගණින්නාන්සේලාට ඉලංගකෝන් මැතිණිය විසින් 1707 දී වෙහෙරගම් පිටින් ඉඩමක් ද පරිත්‍යාග කොට ඇත.

ක්‍රමයෙන් බෞද්ධ කටයුතු ප්‍රබලවීමත් ක්‍රිස්තියානින්ට විරුද්ධව එළිපිට ක්‍රියා කිරීමට ජනතාව ඉදිරිපත් වීමත් උඩරට රජතුමා නිරන්තරයෙන් පහතරට බෞද්ධයන්ගේ ආගමික වත් පිළිවෙත් නිදහසේ පවත්වාගෙන යාමට ඉඩදෙන ලෙසටත් කළ ඉල්ලීම නිසා ත් බෞද්ධ වත් පිළිවෙත්වල පහතරටියා යෙදීමෙන් වෙළඳ සමාගමේ රජයට ඇති පක්ෂපාතිත්වයට පහරක් නො වදින හෙයිනුත් කොළඹ දේශපාලන

මණ්ඩලය 1704 දී බෞද්ධයන් බෞද්ධාගම අනුව වත් පිළිවෙත් කිරීම අවහිර කිරීමෙන් රජය වැලකිය යුතු යැයි තීරණය කළාය. [56] මෙය ගණින්නාන්සේලා කාලයක් තිස්සේ කැපවීමෙන් ක්‍රියා කිරීම නිසා උදා වූ සහනයකි. ක්‍රියාත්මක වී මේ දී එය ද අවස්ථාවෝචිතව වෙනස් විය.

රජයේ සහනශීලී ප්‍රතිපත්තිය ප්‍රයෝජනයට ගත් ගණින්නාන්සේවරු ආරක්ෂිත ප්‍රදේශ වලින් ඉවත් වී එළිමහනේ ආගමික කටයුතුවල යෙදෙන්නට වූහ. මේ නිසා ඊට විරුද්ධ වූ ප්‍රෙඩිකාන්ට්වරුන් හා පාසල් පරීක්ෂකවරුන් සමඟ ගැටිණ. නුවර රාජධානියේ සිට භික්ෂූන් වහන්සේලා පහතරට ප්‍රදේශවලට පැමිණ ගණින්නාන්සේලාට ආධාර කරමින් ආගමික කටයුතුවල යෙදෙන්නට වූහ. ඇතැම්විටක ඕලන්ද පළාත්වල ඉදි කෙරෙන ක්‍රිස්තියානි පල්ලිවලට ද විරුද්ධත්වය පළ කළහ. 1742 හාපිටිගම් කෝරළයේ පාසල් - පල්ලියක් තැනීමට කටයුතු කරද්දී උඩරටින් මෙන්ම පහත රටින් ද විරුද්ධතා ඇති විය. [57] මේ අතර ස්වදේශීය මුලාදෑනීන් ද එළිපිට තම සහයෝගය භික්ෂූන් වහන්සේලාට දීමට ඉදිරිපත් වූහ. 1738 දී හික්කඩුව අසල අකුරැටියේ සිල්වතා නමින් ඕලන්ද ලේඛනවල හැඳින්වෙන බෞද්ධාගම වැළඳ ගත් ඕලන්ද යටත් වැසියෙක් මුලාදෑනියාගේ ඉඩමක තාවකාලිකව ගොඩ නැඟූ මඩුවත් තුළ බණ කියද්දී ඕලන්ද නිලධාරීන් විසින් අල්ලා ගත් බවට වාර්තා වෙයි. [58] පාසල් පරීක්ෂවරුන් හා පල්ලියේ ගුරුන්නාන්සේලා පවා රජයේ නියෝග නො සලකා හැර බෞද්ධයන්ට අනුකූලතාවෙන් ක්‍රියා කළ බවට නොයෙක් සාක්ෂ්‍ය ඇත. ඔවුන්ගේ කටයුතු පරීක්ෂාවට පැමිණ උසස් නිලධාරීහු බොහෝවිට ගැමියන්ගේ ගල් ගැසීම්, උසුළු විසුළු කිරීම් හා සෝෂාවනට ලක් වූහ. තවත් අවස්ථාවල ඔවුන්ට එරෙහිව කාය බල ශක්තිය ද පාවිච්චි කෙරිණ.

මේ කිසිවකින් පසු බට නොවූ ඕලන්ද පූජකවරු ඇතැම් විට බෞද්ධ ආගමික මධ්‍යස්ථාන බලහත්කාරයෙන් විනාශ කර දැමූහ. බැතිමතුන් වන්දනාමාන කළ බෝ ගස් කපා හෙලූ බවට බෞද්ධයෝ චෝදනා කළහ. [59] 1740-1741 ගාලු කොමාන්ඩරියේ කළ නිලසංචාරයකදී ඒ. ඩබ්ලිව්. පැබ්රිකස් පූජක තුමා සහ ස්කොලාච් පීටර් ද සාල්වේ පරගහතොට හා ආදාදොල පිහිටි බෞද්ධ විහාර විනාශ කොට බෝ ගස් කපා හෙළා දැමූහ. [60] එහෙත් 18 වන සියවස අවසාන කාලය වන විට බුද්ධාගම බලහත්කාරයෙන් යටපත් කොට දැමිය නො හැකි බැව් තේරුම් ගත් රජය බෞද්ධ ආගමික මධ්‍යස්ථාන සමඟ සමීප සම්බන්ධතා ඇති කර ගැනීමට ක්‍රියා කළාය.

18 වන සියවස අවසාන කාලයේ මාතර ප්‍රදේශයේ ප්‍රබල තත්ත්වයකින් ක්‍රියාත්මක වූ මෙම බෞද්ධ පුනර්ජීවන කටයුතු භික්ෂු පරපුර කිහිපයක් වටා ඉදිරිපත් කිරීමට මෙතෙක් ලේඛකයෝ ඉදිරිපත්ව සිටිති. සිටිනාමළුවේ ධම්මජෝති හා වේහැල්ලේ ධම්මදින්න හිමියන් නිසා ආරම්භ වුවා සේ හඳුන්වන වේහැල්ලේ පරම්පරාවද, වටරක්ගොඩ ධම්මපාල හා බෝවල ධම්මානන්ද හිමියන් ප්‍රමුඛව ආරම්භ වූ මුල්ගිරිගල පරම්පරාවද අගලකඩ ධම්ම රක්ඛිත හිමියන්ගේ අගලකඩ පරම්පරාව ද මේ අතර ප්‍රමුඛත්වයෙන් සලකා ඇත. ඒ අතරම මේ කාලය වන විට භාෂා ශාස්ත්‍ර ප්‍රගුණ කළ කාව්‍ය රචනාවෙහි නියුක්ත වූ ගිහියන් විශාල පිරිසක් ද විය. මොවුන් අතර ඕලන්ද රජය යටතේ ක්‍රියා කළ ප්‍රධාන මුලාදෑනි පිරිස් ද වූ බව ලේඛන ගත තොරතුරු ආශ්‍රයෙන්ම තහවුරු වේ. [61] එනමුදු ඔවුන් මෙම භික්ෂු පරපුරුවලට ඇති සම්බන්ධය පරීක්ෂා කිරීම පහසු නොවේ.

පහතරට සියම් නිකායික භික්ෂු පරපුරේ ආරම්භකයා වශයෙන් සැලකෙන වේහැල්ලේ ධම්මදින්න හිමියන් හා ඔහුගේ ජ්‍යෙෂ්ඨ සද්ධි විහාරික සිටිනාමළුවේ ධම්මජෝති හිමියන්ගේ ආචාර්යවරයා වූයේ 1698 දී ගැටඹේ දී රක්ඛංග දේශී භික්ෂූන් අතින් උපසම්දාව ලැබ ගිරුවාපත්තුවේ මුදලිවරයා වූ දොන් සයිමන් සෙනෙවිරත්න විසින් පුනරුත්ථාපනය කළ කහඳව විහාරයේ වැඩ වාසය කළ කඳුරුපොකුණේ නවරත්න බුද්ධරක්ඛිත ගණින්නාන්සේ ය. [62] අමරපුර නිකායේ ආරම්භයට මුල් වූ මුල්ගිරිගල පරම්පරාවේ බෝවල හිමියන්ගේ ගුරුවරයා වූයේ තලගම මනිරතනය. එතුමාගේ ගුරුවරයා වූයේ වටරක්ගොඩ ධර්මපාලය. වටරක්ගොඩ හිමියන්ගේ ගුරුවරයා වූයේ කළුගල ගණින්නාන්සේය. [64] මේ අනුව 18 වැනි සියවසේ අවසාන කාලය වන විට පහතරට ප්‍රදේශය පුරා පැතිර ගිය බෞද්ධ ප්‍රබෝධයට මුල් වූ ගණින්නාන්සේලා පිළිබඳ අඛණ්ඩ සටහනක් අපට කැටිකර ගත හැකි වෙයි. ජීවිත පරදුවට තබා බෞද්ධ ශාසනය වෙනුවෙන් ක්‍රියා කළ කසාවත් හැඳීම අන්තරායකාරී වූ අවස්ථාවේ කටයුතු කළ අය ගණින්නාන්සේ වශයෙන් ද හැඳින්වීමට පුරුදු වූ බව මෙහි දී අවබෝධ කර ගත හැක.

දකුණේ වූ විහාර වලින් මෙම දුර්භාග්‍ය සම්පන්න කාලයේ ඉතිහාසයේ දී කිසියම් තොරතුරු ප්‍රමාණයක් කැටි කළ හැක්කේ මුල්ගිරිගල විහාරය හා සම්බන්ධවය. කැලණිය මෙන් නොව

මුල්ගිරිගල ඕලන්ද කටයුතු වලින් ඈත්ව හුදකලා පිහිටි ස්ථානයක් වූ හෙයින් එහි කටයුතු ඕලන්ද ලේඛනවලට ඇතුළත් වූයේ ඉතා ස්වල්ප වශයෙනි. තවද කැලණිය මෙන් නොව මුල්ගිරිගල ස්වාභාවික පිහිටීම නිසා ප්‍රබල විනාශයකට මුහුණ නොදී වුවද එහි කටයුතු දිගටම පවත්වා ගෙන යාම පහසු විය. විශේෂයෙන්ම දුෂ්කර අවස්ථාවේ ගණින්නාන්සේ ගත කළ ජීවිතයට යෝග්‍ය ස්ථානයක් ද වූයේය. එපමණක් ද නොව එහි ඓතිහාසික සම්ප්‍රදාය නිසා මුල්ගිරිගල ප්‍රධාන කර ගත් ගණින්නාසේට පෙර කල ඊට සම්බන්ධ කොට තුබූ පරිවාර වෙහෙර විහාරවලින් ද සහයෝගය ලැබෙන්නට ඇත. ඕලන්දයන්ගේ කහවත්ත පාසල - පල්ලිය පිහිටියේ ද මේ ආසන්නයේමය. 18වන සියවස මුල්කාලයේ සිටම බෞද්ධ භික්ෂූන් වහන්සේලා මෙම ස්ථානය මුල් කොට ක්‍රියා කරන බවට පාසල් අධිකාරිය මගින් ආණ්ඩුවකාරයා වෙත නොයෙක් වර වාර්තා කෙරිණි. (65) කෙසේ වතු දූ තහනම් නියෝග නොසලකා හැර ගණින්නාන්සේලා ආගමික කටයුතු සංවිධානය කිරීම හා ඊට ජනතා සහයෝගය ලැබීම නිසා ද අනිවාර්යයෙන්ම ඔවුන් උඩරට රජුට පක්ෂපාතී හෙයින් ද නිරන්තරයෙන් පහතරට ප්‍රදේශවල ඇති වූ කැරළි කෝලාහල වල දී ගණින්නාන්සේලාත් සැලකිය යුතු ප්‍රමාණයකින් කැරළිකරුවන් ධෛර්‍ය්‍ය සම්පන්න කරන හෙයින් උපායෙන් ඔවුන් ඕලන්දයන්ට පක්ෂපාතීව තබා ගැනීමට ආණ්ඩුකාරවරු ක්‍රියා කළහ. ජනප්‍රිය ආණ්ඩුකාරවරු භික්ෂූන් සමඟ සාකච්ඡා කොට බෞද්ධයනට නිදහසේ ආගම ඇදහීමට ඉඩදෙන බවට පොරොන්දු වූහ. (66) පසුව ආfපොල්ක් හා පන්ඩර් ග්‍රාf්ප් ආණ්ඩුකාරවරු මුල්ගිරිගල භික්ෂූන් සමඟ සමීප සම්බන්ධතා ගොඩනඟා ගැනීමට සමත් වූහ. 1765 පෙබරවාරි 3 වන දින මාතර දිසාව මුල්ගිරිගල මහා නාහිමියන්ට මාතර ප්‍රදේශයට පැමිණ බෞද්ධ විහාර ප්‍රතිසංස්කරණය කිරීමට හා සම්ප්‍රදායික ආගමික උත්සව පැවැත්වීමට ආරාධනය කළේය. (67)

මුල්ගිරිගල භික්ෂූන් උඩරට රජතුමා සමග නිරන්තර සම්බන්ධතා පැවැත්වීය. රජුගේ නිලධාරීහු අතරින් පතර මුල්ගිරිගලට පැමිණ අවශ්‍ය පහසුකම් සපයා දීමට ක්‍රියා කළහ. 1761 දී ගලගොඩ අදිකාරම් තුමා මුල්ගිරිගල විහාරයේ යැපීම් සඳහා ඉඩම් පූජා කළ අතර රජතුමා බිතු සිතුවම් ඇඳීම සඳහා සිත්තරුන් කණ්ඩායමක් එවීය. (68) මේ අනුව 18

වන සියවස අවසාන කාලය වන විට උඩරට රජු මෙන්ම ලන්දේසීහු ද පහතරට බෞද්ධ විහාරාරාම වල පක්ෂපාතිත්වය දිනා ගැනීමේ උත්සාහයක යෙදී සිටියහ. ටර්නර්ට මහාවංශ පිටපත ලබා ගත හැකි වූයේ ද මුල්ගිරිගල පුස්තකාලයෙනි.

මෙලෙස බෞද්ධයන්ට තම කටයුතු නිදහසේ පවත්වා ගෙන යාමට අවස්ථාව සැලසීම නිසා මාතර හා ගාලු දිස්ත්‍රික්ක වල පැරණි ආගමික මධ්‍යස්ථාන පුනරුත්ථාපනය කෙරුණ අතර අලුත් විහාරාරාම ද ගොඩ නහන්නට පටන් ගැණිනි. 1751 පයාගල ද, 1752 වැලිගම හා කහවේ ද අලුතින් විහාර ආරම්භ කෙරිණ. 1765 යුද්ධයෙන් පසු මුලාදෑනීහු පල්ලි ගොඩනැගීම හා ප්‍රතිසංස්කරණය කිරීම ප්‍රතික්ෂේප කළ අතර බෞද්ධ විහාරාරාම ගොඩ නැගීමට අනුබල දීමට පටන් ගත්හ. පාසල් වයසේ ළමුන් පල්ලි පාසලට යැවීම ප්‍රතික්ෂේප කළ බොහෝ දෙනා දරුවන්ගේ අධ්‍යාපනය භික්ෂූන්ට භාර කළහ. මෙලෙස මාතර හා ගාලු දිස්ත්‍රික්ක වල බෞද්ධ පුනර්ජීවනයේ නව ප්‍රවණතාවක් පෙන්නුම් කළ අතර මෙවැනි පිබිදීමක් කොළඹ දිස්ත්‍රික්කය තුළ විද්‍යාමාන නොවීය. [69]

18 වන සියවස අවසාන කාලයේ මාතර හා ගාල්ල ප්‍රදේශයේ සිටි ජ්‍යෙෂ්ඨ මුලාදෑනිවරු සෑම කෙනෙක්ම පාහේ හිතකාමීන් වූ අතර සාහිත්‍ය කටයුතු වල නියුක්ත වූවන්ට අනුග්‍රාහක තත්ත්වයෙන් ද ක්‍රියා කළේය. එහෙයින් එය විශිෂ්ට ආගමික හා භාෂා ශාස්ත්‍රීය පුනර්ජීවනයකට හේතුවිය. ප්‍රතිකාලුන් විසින් විනාශ කර දැමූ පැරණි විහාරාරාම පිහිටි ස්ථාන හඳුනාගෙන ඒවායේ නව නිර්මාන ඉදි කළ අතර සම්ප්‍රදායානුකූල කැටයම් චිත්‍ර වලින් අලංකාර කරනු ලැබීය. වෙහෙර විහාර විශාල ප්‍රමාණයක් අලුතින් ඉදි කෙරිණ. බෞද්ධයන් තුළ ඇති වූ මෙම ප්‍රබෝධය නිසා පාසල්- පල්ලි සංවිධානය බෙහෙවින්ම දුර්වල වී ගියේ ය. නව ප්‍රබෝධයේ එක් සන්ධි ස්ථානයක් සනිටුහන් කරන්නකි. ගංගා රෝහණ වර්ණනාවෙන් විස්තර කෙරුණු මාතර ගහබොඩ පත්තුවේ මුදලි වූ ඩේවිඩ් ද සරම් විසින් අකුරැස්සේ ගොඩපිටියේ ඉදිකළ තුන් මහල් ධර්ම ශාලාව විවෘත කිරීමේ උත්සවයට මාතර සිට ගොඩපිටිය දක්වා නිල්වලා ගඟේ සැතපුම් 14 ක් දුර ප්‍රමාණය ඔරු වලින් යමින් ගම් 22 ක ධර්ම දේශනා පවත්වා අවසානයේ ගොඩපිටිය ජයවර්ධනාරාමයේ පැවැත්වූ මහා පූජෝත්සවය. එම ප්‍රයාමයේ ප්‍රථම ධර්ම දේශනාව කරතොට ධර්මාරාම හිමියන් විසින් මාතරදී පැවැත්වූ අතර අවසාන ධර්ම දේශනය බෝවල

ධම්මානන්ද හිමියන් විසින් ගොඩපිටියේදී පවත්වනු ලැබිණ. යුගයේ මහා පුරුෂයන්ගේ සහභාගිත්වයෙන් කෙරුණු මෙම උත්සවය අළලා රචිත ගංගාරෝහණ වර්ණනාව පසු කලෙක ප්‍රබල සාහිත්‍ය විවාදයක් සඳහාද මං පෑදුවකි. (70)

ඉහත සඳහන් කළ තහංචි ක්‍රියාත්මකව පවත්වා ගෙන ගිය රජයක් පැවති කාලය තුළම බෞද්ධාගමේත් බෞද්ධාගම හා එක්ව වර්ධනය වූ භාෂා සාහිත්‍යයේත් සංස්කෘතියේත් පුනරුදයක් ඇතිවීම තරම් ප්‍රබල බලවේගයක් කාලයක් තිස්සේ අඛණ්ඩව ක්‍රියාත්මක වූ මහත් ආයාසකාරී බලවේගයකින් තොරව මතු විය නොහැක. පීඩනය වැඩිවෙත්ම පීඩනය මගින් ජනිත කරවන ප්‍රතික්‍රියාවක් තුළින් එම පීඩනය ඉවතලන ආකාරය ඉතිහාසය තුළින් නිරන්තරයෙන් පැහැදිලි වන්නෙකි. එහෙත් මෙම ක්‍රියාවලිය යථා තත්ත්වයෙන් අවබෝධ කර ගැනීම දුෂ්කර වන ආකාරයෙන් තොරතුරු සැඟවී තිබීම නිසා එක් එක් පක්ෂයේ කැමැත්ත අනුව ශේෂ වූ තොරතුරු අර්ථ කථනය කිරීමට නිසා තත්ත්වය තවත් සංකීර්ණ වේ. 17- 18 වන සියවස් පහතරට පෙදෙස්වල ආගමික හා භාෂා සාහිත්‍යමය විෂයෙහි අන්ධකාර කාලයක් සේ විස්තර කිරීමකට මඟ පෑදුනේ මේ නිසාය. එසේම 18 වන සියවස අවසානයේ වැලිවිට සඟරජ හිමියන් ප්‍රමුඛ උඩරට සෘජු බලපෑම නිසා පහතරට ආගමික හා භාෂා සංස්කෘතික පුනරුදයක් ඇතිවී ය යන නිගමණයට එළඹිණ. එහෙත් පැවති තත්ත්වය ක්‍රමානුකූල විශ්ලේෂණය කිරීමක් තුළින් හා ගණිත්තාන්සේලාගේ කටයුතු පරීක්ෂා කිරීම තුළින් මෙම අදහස් යළි සළකා බැලීමට මං පෙත් හෙළිවෙයි. ගණිත්තාන්සේලා විසින් පහතරට පළාත්වල ආරක්ෂා කර තිබූ සම්ප්‍රදායික දැනුම් බෙදා ගැනීම තුළින් මතු වූ වේහැල්ලේ ධම්දින්න හිමියන්ගේ ගෝලයෙකු වූ කඹුරුපිටියේ ගුණරතන හිමි උඩරට අධ්‍යාපනික සංවිධානවලින් අධ්‍යාපනය නො ලැබුව ද වැලිවිට සරණංකර සංඝරාජ හිමියන්ට අවසාන බණ කීමට තරම් නිපුණතාවකින් පසු වූ බැව් පෙනේ. (71) එසේම බාලවතාරයේ කොටසක් සඟරජ හිමියන්ට කියාදී සඟරජ හිමියන් ලෙව්කේ දිසාවගෙන් උගත් කොටස තමා උගැන්මට තරම් ශක්තියක් සිටිනාමළුවේ හිමිට වූ බැව් පෙනේ. (72) මේ සියලු තොරතුරු කැටිකරගත් විට බෞද්ධාගමත් ඊට සම්බන්ධව පැවති භාෂා සාහිත්‍ය හා සංස්කෘතිකමය අනන්‍යතාව ආරක්ෂා කර ගැනීම සඳහා වූ ප්‍රබල බලවේගයක් ගණිත්තාන්සේලා තුළින් ක්‍රියාත්මක වූ බවත් ඊට උඩරට රාජධානිය තුළින් ඊටම සරිලන ආධාරක හස්තයක් දික් වූ බවත් තේරුම් ගැනීම පහසු වනු ඇත.

# පාදක සටහන්

01. චූලවංශය. 93 පරිච්ඡේදය 10-11 පද්‍ය.

02. Ribeiro, Historic Tragedy of the Island of Ceilao" Tr. & ed. by Pieris P.E.

03 Trinidade, F.P.D., Chapters on the Introduction of Christianity to Ceylon, 1972.

04. සඟරජවත.

සංඝරාජ සාධුචරියාව.

05. Life of Fr. Jacome Gonsalvez, ed. Fr. S.G. Perera.

ජාකොම් ගොන්සල්වේස් පියතුමා, බුද්ධ බණ ප්‍රත්‍යක්ෂය, 1932. කොළඹ.

06. Goonawardene, K.W., Dutch Policy Towards Buddhism in Sri Lanka and some Aspects of its Impact, C. 1640-C 1740, Asian Panorama: Essays in Asian History, Past & Present, ed. by K.M. De Silva. Sirima Kiribamune & C.R. De Silva, Vikas Publishing House 1990.

මිරන්ඩෝ ඒ. එච්., 17-18 සියවස්හි සිංහල සාහිත්‍ය, 1988, කොළඹ.

07 Knox. 1966.

08 Ibid.

09 සඟරජවත, පද්‍ය 54-64.

10 කඩදොර සිට්ටුව.

11. Journal of the Royal Asiatic Society (Ceylon Branch) (RASCB) Vol.X, No.41. pp. 6-14.

12. Ceylon Antiquary Vol.1. Part II, p.121.

13. Ceylon Antiquary Vol.II. Part III, p.17.

14 වාචිස්සර, කොටගම., සරණංකර සංඝරාජ සමය, 1960. පිටු 57-59.

15 Bailey., Ceylon, p.42.

16. Ribeiro., 1907, p. 75.

Trinidade., pp. 51-55.

Queyroz, Fernao de, The Temporal and Spiritual Conquest of Ceylon, Tr. by S.G. Perera, 1930. P.427, 441, 714-717.

17. Abeyasinghe., Tikiri., Portuguese Rule in Ceylon, Colombo 1966, p. 209.

18 Boxer, C.R., History Today, 1958, pp. 348-349.

19. මිරැන්ඩෝ. ඒ. එච්., 1988' පිටු 14-33.

20. වැඩි විස්තර සඳහා කියවන්න (Goonewardene, K.W., 1990, pp. 320-322.

21. Ibid. p.321.

22. Sri Lanka National Archives (SLNA) 1/2438.

23. SLNA 1/2440.

24. SLNA 1/2454.

25. Palm J.D., An Account of the Dutch Church in Ceylon, J.RASCB. Vol.1. No. 3. (1847-1848) pp.19-56.

26. Ibid.

27. SLNA., 1/2454.

28. SLNA.1/5949.

29. SLNA. 1/2454.

30. Perniola,V., Catholic Church in Sri Lanka, 1658-1711, Vol.1. pp.38-94.

32. Ibid. p.71.

33. Perniola, V., Cathiolic Church in Sri Lanka, Vol.2, 1712-1746. pp.321-352.

34. Ibid. p. 69.

35. Kanapathipillai; V. ,Dutch Rule in Maritime Ceylon, 1766-1795, ( Unpublished Ph. D. Thesis, Univeristy of London) 1969,p.258.

36. වෙහැල්ලේ ශ්‍රී පාද සන්නස, කිරිඇල්ලේ ඥාණවිල හිමි., සබරගමුවේ පැරණි ලියවිලි පිට. 17.

37. ගොන්සල්වේස්, ජාකොම් පියතුමා., බුද්ධ බණ ප්‍රත්‍යක්ෂය (1932) පිට. 45.

38. Perniola., Vol.2. 1712-1746,p.321.

39. Ibid. p,352.
40. Memoir of Thomas Van Rhee, 1697.
41. Goonewardene, K.W., 1990, p.335.
42. Ibid. pp. 336-338.
43' SLNA 1/2438.
44. Goonewardene, K.W., 1990. p.335.
45. Palm, J.D., pp.30-32.
46. Malalgoda Kirsiri., Buddhism in Sinhalese Society, 1750-1900, Berkley, 1976, p. 38.
47. Jurrine Van Goor., " Protestanism and Other Relilgions Under the Dutch in Sri Lanka", Don Peter Feicitation Volume, 1983, p. 116.
48. Gonewardene, K.W., 1990.p 339.
49 මිරැන්ඩෝ ඒ. එච්. , 1988, පිට. 21.
50 Jurrien Van Goor., Jan Kompenie as Schoolmaster, Dutch Edu cation in Ceylon, 1690-1795, pp.133-143.
52. Ibid. p. 180.
53. Ibid.p. 271.
54. Memoir of Jan Schreuder, 1762, Colombo, 1914, p. 13.
55. Goonewardene, K.W., 1990, pp. 339-431.
56. Van Goor J., 1983, pp. 1035-118
57. Kotalawala, D.A., The Dutch in Ceylon 1743-1766, ( Unpub lished Ph. D. Thesis, University of London) 1968, p. 46.
58. Goonewardene, K.W., 1990.p. 345.
59. Van Goor. J., 1983. p. 119.
60. Goonewardene, K.W., p. 435.
61. හේවාවසම්. ප. බ. ජී ., මාතර යුගයේ සාහිත්‍ය ධරයන් හා සාහිත්‍ය නිබන්ධන, 1966, මිරැන්ඩෝ ඒ . එච්., 1988. ,
62. විමලකිත්ති මැද උයන්ගොඩ., මාතර සාහිත්‍ය යුගය, 1953, පිටු 11.
63. Ibid. p. 56.

65. Goonewardene, K.W., 1990, p. 334.

66. Van Goor, J ., 1983, 116.

67. Dewaraja L.S. , Kandyan Kingdom, 1707-1782, p. 119.

68. Ibid.

69. Van Goor J., 1983, p. 117.

70. ගංහා රෝහණ වර්ණනාව , කුමාරතුංග මුනිදාස සංස්කරණය, 1934..

71. හේවාවසම් ප. බ. ජී ., 1966, පිට. 46.

72. Gunawardene W. F. , Guttila Kavya Vannana, 4th Edition, p. xviii.